# UNIVERSITY OF PERADENIYA

# CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 300 මට්ටම - 2021**

**இளங்கலைமாணிப் பட்ட பரீட்சை (வெளிவாரி-புதிய பாடத்திட்டம்) 300 வது தேர்ச்சி மட்டம் 2021**

**Bachelor of Arts (External - New Syllabus) Examination 300 Level – 2021**

## BPHE -302: බුදුසමය හා දාර්ශනික ගැටලු
## Buddhism and the Problems of Philosophy

**උපදෙස්/ Instructions:**

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. / Answer **FIVE** questions only.

මෙම පත්‍රයෙහි ප්‍රශ්න සංඛ්‍යාව 08 කි. / This paper contains 08 questions.

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ. / All questions carry equal marks.

මෙම ප්‍රශ්න පත්‍රයට වෙන්වන මුළු ලකුණු ප්‍රමාණය 100% කි. / Total marks allocated for this paper is 100%.

---

1. බුදු සමය ආගමක් ලෙසින් සැලකිය හැකිවන නමුත් දර්ශනයක් ලෙසින් සැලකිය නොහැකි බවට සමහරුන් විසින් දරණු ලැබෙන මතය පිළිබඳ ඔබගේ අදහස් ප්‍රකාශ කරන්න.

   Express your ideas on the view held by some that Buddhism could be considered as a religion but not as a philosophy.

2. දාර්ශනික චින්තනය පිළිබඳ බෞද්ධ ආකල්පය කුමක්දැයි දීඝනිකායෙහි බ්‍රහ්මජාල සූත්‍රය විශේෂයෙන් ඇසුරු කරමින් පෙන්වා දෙන්න.

   Show with special reference to the Brahmajāla Sutta of the Dīghanikāya what the Buddhist attitude towards philosophical thought is.

3. පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සම්බන්ධයෙන් මතුවන දාර්ශනික ප්‍රශ්න කවරේදැයි පැහැදිලි කරන්න.

   Explain what philosophical problems arise in connection with the Buddhist teaching on rebirth.

4. බෞද්ධ දර්ශනය අනුව ශුද්ධ තර්කය යථාර්ථය පිළිබඳ නිගමනවලට එළඹීම සඳහා කොතෙක් දුරට යොදාගත හැකිවේදැයි විමසන්න.

   Examine the extent to which pure reason could be employed in arriving at truths relating to reality according to Buddhist Philosophy.

**අනෙක් පිටුව... / PTO ...**

5. පුද්ගල සංකල්පය බෞද්ධ දර්ශනයේ විශ්ලේෂණය කෙරෙන ආකාරයෙන් ගම්‍යවන දාර්ශනික අංශ සාකච්ඡා කරන්න.

Discuss the philosophical aspects implied by the way in which the concept of person is analyzed in Buddhist Philosophy.

6. කය සහ මනස අතර සම්බන්ධතාවේ ස්වභාවය ගැන දර්ශන ඉතිහාසයේ දී ඉදිරිපත්ව ඇති අදහස් සමග සසඳමින් ඒ පිළිබඳ බෞද්ධ මතය පැහැදිලි කරන්න.

Explain the Buddhist view about the nature of the body-mind relationship in comparison with the ideas presented about it in the history of philosophy.

7. මුල් බුදු සමයෙහි දක්නට ලැබෙන බාහිර භෞතික ලෝකයක පැවැත්ම පිළිබඳ දාර්ශනික ස්ථාවරය පැහැදිලි කොට එය පසුකාලීන බෞද්ධ දර්නයෙහි විඥානවාදයට නැඹුරු වූ අයුරු පෙන්වා දෙන්න.

Explain the philosophical stance of Early Buddhism on the existence of an external material world, and show how it inclined towards idealism in later Buddhist Philosophy.

8. තථාගතයන්ගේ මරණින් මතු පැවැත්ම පිළිබඳ සිව් ආකාරයකින් මතුකරන ලද ප්‍රශ්න බෞද්ධ චින්තනයෙන් අව්‍යාකත ලෙස බැහැර කිරීමේ යුක්තියුක්තභාවය දාර්ශනික දෘෂ්ටිකෝණයකින් සාකච්ඡා කරන්න.

Discuss from a philosophical perspective the justification for leaving aside in Buddhist thought questions raised in four ways regarding the existence of the *Tathāgata* after death.

==============